# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2320/58 - 2023 පෙබරවාරි මස 22 වැනි බදාදා - 2023.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39(3) වන වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ කරනු ලබන නියමය

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39(3) වන වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ මුදල් පාලනය, පරිපාලනය, ක්‍රීඩාවේ ප්‍රවර්ධනය හා සම්බන්ධ වන කරුණු පිළිබඳව විමර්ශණය කර, ඊට අදාළ නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් මෙම *ගැසට් පත්‍රය* මුද්‍රණය කළ දින සිට මාස දෙකක් ගත වීමට පෙර මා වෙත ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත කමිටුව පත් කරමි.

| | | | |
|---|---|---|---|
| I. | සරෝජනී කුසලා වීරවර්ධන මහත්මිය | - | විශ්‍රාමික මහාධිකරණ විනිසුරු (කමිටු සභාපති) |
| II. | කිංස්ලි ප්‍රනාන්දු මහතා | - | හිටපු අමාත්‍යාංශ ලේකම් (කමිටු සාමාජික) |
| III. | සුදත් නාගහමුල්ල මහතා | - | විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති (කමිටු සාමාජික) |
| IV. | ආනන්ද පීරිස් මහතා | - | විශ්‍රාමික රියාද් අද්මිරාල් (කමිටු සාමාජික) |
| V. | සුසිල් රොහාන් රාමනායක මහතා | - | (කමිටු සාමාජික) |
| VI | නීතිඥ ශලිනි රොෂානා ප්‍රනාන්දු මෙනවිය | - | (කමිටු ලේකම්) |
| | ඩබ්ලිව්. එම්. අයිරාංගනී විජේරත්න මිය | - | ලඝු හා යතුරු ලේඛිකා |

මෙම කමිටුව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

1. පාපන්දු සම්මේලනය 2012 වර්ෂයේ සිට එහි නව ව්‍යවස්ථාව සැකසීමේ කටයුතු ප්‍රමාද කිරීම
2. 2018 වර්ෂයේ සිට පාපන්දු සම්මේලනයේ මුදල් පාලනය
3. පාපන්දු සම්මේලනයේ පරිපාලනය
4. ඡන්දය ලබා ගැනීමේ අරමුණින් පිහිටුවා ඇති නාමික පාපන්දු සමාජ
5. කාර්යාල කටයුතු සඳහා සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය, වැටුප් ගෙවීම් සහ ඔවුන්ගේ කාර්යභාරය
6. අනාගත පාපන්දු ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග සහ නිර්දේශ

සෑම පුරවැසියෙකුටම තම අභිමතය පරිදි තමා කැමති ක්‍රීඩාවක, තමන් කැමති ප්‍රදේශයක දී නියැලීමට ඇති මානුෂික අයිතිවාසිකම ආරක්ෂාවන පරිදි පහසුකම් සැලසිය යුතුය.

ඉහත කී කාර්යයන් ක්‍රියාවේ යෙදවීම සඳහා 39(3) වගන්තිය යටතේ අවශ්‍ය විය හැකි සියලු පහසුකම් ලබාගැනීමටත් සියලු තොරතුරු, ඒ සභා, කමිටු, සංගම් සහ වෙනත් මණ්ඩලවලින් ලබා ගැනීමටත් මෙම කමිටුවට බලතල පවතින බවට මෙයින් දන්වා සිටිමි.

ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය හා පක්ෂපාතීත්වය ගැන මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත විධිවිධාන ප්‍රකාරව පිහිටුවන ලබන අතර විශේෂ විමර්ශණ කමිටුවේ ඉහතින් දක්වා ඇති විමර්ශණයන් ක්‍රියාවට නංවනු පිණිස අවශ්‍ය විය හැකි සියලුම පියවර ගන්නා මෙන් ඔබතුමන්ලාට මම මෙයින් නියම කරමි.

**රොෂාන් රණසිංහ (පා.ම.),**
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 පෙබරවාරි මස 21 වන දින,
කොළඹ දී ය.

EOG 02-0263

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.